Sinhala/සිංහල

Australian Electoral Commission

# නැවතී සලකා බලන්න

## මහ මැතිවරණයක් අතරතුර චන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව බොහෝ දේ කියැවෙනු හා ලියැවෙනු ඇත. **ඒවායින් සමහරක් අසත්‍ය හෝ නොමඟ යවන සුළු ඒවා විය හැක.**

මෙම ක්‍රියාවලිය ගැන ඔබ දකින, අසන හෝ කියවන දේවල අන්තර්ගතය සහ මූලාශ්‍රය ගැන නැවතී සලකා බලන්න.

ඡන්දය දිය යුතු ස්ථානය, ඡන්ද පත්‍රිකා සම්පූර්ණ කරන්නේ කෙසේද යන්න හෝ ක්‍රියාවලිය විශ්වාසදායක නොවන්නේ මන්දැයි පිළිබඳව ඔබ නොමග යැවීමට AI-ජනනය කරන ලද පෙළ, ශ්‍රව්‍ය හා  දෘශ්‍ය උපක්‍රම භාවිතා කළ හැකිය. **ඕනෑම කෙනෙකු බලපෑම්වලට ලක්විය හැකිය**.

සාධාරණ සැකයක් ඇතිකරගන්න. එය පරීක්ෂා කිරීම හෝ නොසලකා හැරීම කල හැකි නමුදු එය බෙදා ගැනීම හෝ නැවත පළකිරීමෙන් වළකින්න. ඔබ එය දුටු ස්ථානයට ද වාර්තා කළ හැකිය. මිතුරන්ට සහ පවුලේ අයටද එසේ කිරීමට සහාය වන්න.

ලෝකයේ වඩාත්ම විශ්වාසදායක මැතිවරණ ක්‍රමවේදයක් ඕස්ට්‍රේලියාව සතුව ඇත. එය ඡන්දදායකයින්ට අයත් වන අතර එය ආරක්ෂා කිරීම අප සැමගේ වගකීමකි.

## අප සතු දේ අවදානමට ලක් නොකරන්න.

### අන්තර්ගතය පරීක්ෂා කරන්න

**පහත දෑ ගැන සුපරීක්ෂාකාරී වන්න:**

- කම්පනය, කෝපය හෝ කලබලය වැනි ප්‍රබල හැඟීම් ඇති කරන වචන
- ඉදිරිපත් කරනු ලබන්නේ සියලු තේරීම් වෙනුවට කුඩා තේරීම් සංඛ්‍යාවක් වීම
- වගකිව යුතු එකම පුද්ගලයා/කණ්ඩායම නොවන විශේෂිත කණ්ඩායමකට හෝ පුද්ගලයෙකුට දොස් පැවරීම
- තර්කයක් කෙරෙහි අවධානය යොමු කරනවාට වඩා පුද්ගලයෙකුට පහර දීම.

### මූලාශ්‍ර පරීක්ෂා කරන්න

**ඔබෙන්ම අසන්න:**

- තොරතුරු පැමිණියේ කොතැනින්ද? එය විශ්වාසදායක ස්ථානයකින්ද?
- ඕස්ට්‍රේලියාවෙන්ද නැත්නම් විදේශයකින්ද?
- එය AI විය හැකිද? AI තාක්ෂණය ව්‍යාජ පෙළ, රූප,ශ්‍රව්‍ය හා දෘශ්‍ය නිර්මාණය කිරීම පහසු කරයි.
- එය ප්‍රකාශයට පත් කළේ ඇයි? සත්‍ය නොවන යමක් ඔබට ඒත්තු ගැන්වීමට යමෙකු උත්සාහ කරනවා විය හැකි හේතුවක් තිබේද?

### අපගේ වෙබ් අඩවිය පරීක්ෂා කරන්න

**සත්‍ය තොරතුරු ලබා ගන්න:**

- ඡන්දය ප්‍රකාශකල යුතු දිනය
- ඡන්ද ගණන් කරන ආකාරය
- ප්‍රතිඵලය තීරණය කරන අයුරු
- AEC ඡන්ද සුරක්ෂිතව තබා ගන්නා ආකාරය.




aec.gov.au 13 23 26

අපෙන් සෘජුවම ඇසීමට අප අනුගමනය කරන්න

Canberra හි මැතිවරණ කොමසාරිස්වරයා විසින් බලාත්මක කරන ලදී
Authorised by the Electoral Commissioner, Canberra

25-2108